**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2014**

---

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත ආයතනයේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 ඔක්තෝබර් 05 දින ආයතනයේ සභාපති වෙත නිකුත්කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම, කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

2011 වර්ෂයට අදාළ විවිධ සැපයුම් වියදම් රු.1,503,002 ක මුදල පූර්ව වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට, සමාලෝචිත වර්ෂයේ විවිධ සැපයුම් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇති ශේෂ සහ ලෙජර් ගිණුම්වල ශේෂ අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| අයිතමය | 2014 දෙසැම්බර් 31 දිනට | | වෙනස |
|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | ලෙජර් ගිණුම් අනුව ශේෂය | |
| | රු. | රු. | රු. |
| වෙනත් ආදායම් | 3,594,364 | 3,799,104 | 204,740 |
| වෙනත් ආදායම් (සමුද්‍රා) | 1,361,489 | 1,142,663 | 218,826 |

(ආ) 2014 වර්ෂයේ සංචාරක සංවර්ධන අරමුදලේ ගිණුම් අනුව, සංචාරක සංවර්ධන බදු හා අපගමන බදු වශයෙන් ආයතනය වෙත ගෙවිය යුතු ගිණුම් ලෙස රු.80,760,765 ක් තිබුණද ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල එය රු.64,243,486 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව රු.16,517,279 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු කුලී ලෙස දක්වා නොතිබුණු රු.440,000 ක් ආයතනයේ විවිධ ණයගැති හා ලැබිය යුතු තැන්පත් යටතේ දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ සටහන් අංක 20 අනුව ක්ෂය සහ ක්‍රමක්ෂය එකතුව රු.35,493,332 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.36,250,997 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.757,665 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) බැංකු සනාථ කිරීම් අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට ආයෝජන වටිනාකම රු.185,105,205 ක් වුවද එදිනට මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම රු.189,988,754 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව රු. 4,883,549 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපචිත වියදම් ලෙස රු.31,395,158ක් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනය අනුව එම ශේෂය රු.29,650,243 ක් වීමෙන් රු.1,744,915 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. විස්තර පහත දැක්වේ.

| | අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | අවසන් තොගය | 2,140,852 | i. විස්තරාත්මක උපලේඛන<br>ii. තොග සමීක්ෂණ වාර්තා |
| (ii) | ලැබිය යුතු ගිණුම් | | |
| | • වෙළඳ ණයගැතියෝ | 11,037,942 | i. ශේෂ සනාථ කිරීම්<br>ii. කාල විශ්ලේෂණය |
| | • විවිධ ණයගැතියෝ හා ලැබිය යුතු තැන්පතු | 4,110,259 | i. ශේෂ සනාථ කිරීම්<br>ii. කාල විශ්ලේෂණය |
| (iii) | ගෙවිය යුතු ගිණුම් | | |
| | • තැන්පතු හා වෙනත් ගෙවිය යුතු ගිණුම් | 2,419,056 | i. ශේෂ සනාථ කිරීම්<br>ii. කාල විශ්ලේෂණ |
| (iv) | ස්ථාවර වත්කම් (2008 වර්ෂයේ ආරම්භක ශේෂය) | 151,776,163 | ශේෂය සැදුම්ලත් ආකාරය දැක්වෙන විස්තරාත්මක වාර්තා |
| (v) | JABIC & UNDP Grant | 12,224,841 | අදාළ ලියකියවිලි ඇතුලත් ලිපිගොනු |

| | | | |
|---|---|---|---|
| (vi) | කෙරී ගෙන යන වැඩ | 29,671,063 | විස්තරාත්මක උපලේඛනය |
| (vii) | පූර්ව වර්ෂ ගැලපීම් | 4,672,010 | ජ'නල් සටහන් සහ උපකාරක ලියවිලි |
| (viii) | ණයට විකුණුම් | 12,347,554 | ජ'නල් සටහන් සහ උපකාරක ලියවිලි |
| (ix) | සංවර්ධන වියදම් | 1,788,459 | විස්තරාත්මක උපලේඛන |

(ආ) 2013 වර්ෂයේ ගිණුම්වල ණයගැති / විවිධ ණයගැති හා ලැබිය යුතු තැන්පතු යටතේ දක්වා ඇති රු. 179,048 ක ශේෂ ප්‍රවර්තන වර්ෂයේ දී අය කර ඇති බව ගිණුම්වල දක්වා තිබුණද ඊට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අතිරික්තයට ගළපන ලද රු.772,219 ක වටිනාකම සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබු රු.5,396,780 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද මෙම ශේෂය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම්වල ආයතනයට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණේ රු.6,511,960 කි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙතින් අයවිය යුතු ලෙස දක්වා තිබූ වර්ෂ 1 සිට වර්ෂ 2 දක්වා පැරණි එකතුව රු.1,144,826 ක්, වර්ෂ 2 සිට වර්ෂ 3 දක්වා පැරණි එකතුව රු.3,240,857 ක් සහ වර්ෂ 3 සිට වර්ෂ 4 දක්වා පැරණි එකතුව රු.1,099,591 ක් වූ හඳුනාගත් වෙළඳ ණයගැති ශේෂ අයකර ගෙන නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී සමුද්‍රා හෝටලය විසින් රු.15,003,291 ක ණයට විකුණුම් සිදුකර තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 සංචාරක හෝටල් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 වගන්තිය. | සංචාරක හෝටලයක් පවත්වාගෙන යාමේ දී ව්‍යාපාරය ලියාපදිංචි කර ඒ සඳහා බලපත්‍රයක් ලබාගත යුතු වුවද සමුද්‍රා හෝටලය ලියාපදිංචි කර නොතිබුණු අතර බලපත්‍ර ලබාගෙනද නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 (3) හා (4) වගන්ති | 2013 වර්ෂයේ අවස්ථා දෙකකදී ආයතනයේ වාහනයක් අනතුරට ලක්වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් හා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන හා 2008 ජූනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව නිල වාහන පහසුකම් සඳහා හිමිකම් නොලබන නිලධාරීන් වෙත ප්‍රවාහන දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.7,186,560 ක් ලබා දී තිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.5 වගන්තිය | කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම පිණිස ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණය, තොග කාල විශ්ලේෂණය සහ පැරණි, යල්පැනගිය හා සෙමින් චලනය වන තොග සහ වෙනත් අයිතම පිළිබඳ ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.146,301,826 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.82,854,594 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 63,447,232ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි. අපගමන බදු ආදායම රු.26,058,745 කින් සහ වෙනත් ආදායම රු.21,180,602 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2010 සහ 2011 වර්ෂවලදී මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණද 2012 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබිණි. 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය සියයට 76.6 ක් විය. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2010 වර්ෂයේදී රු.142,048,450 ක් වූ ආයතනයේ දායකත්වය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වී 2014 වර්ෂයේදී රු.292,786,823 ක් විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ආදායම රු.මිලියන 425.8 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ආදායම වූ රු.මිලියන 366 සමඟ සැසඳීමේදී සියයට 16.4 ක වර්ධනයක් විය. එසේම ඉකුත් වර්ෂයේදී ඉගැන්වීම්, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 283 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.මිලියන 279 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 1.4 ක අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් ආයතනයට ජාතික වෘත්තීය සුදුසුකම(NVQ),ලබාගැනීම සඳහා උපදේශකත්වය හා සහායන් ලබා දුන්නද ආයතනය විසින් ජාතික වෘත්තීය සුදුසුකම ලබා ගෙන නොතිබුණි.

(ආ) ආයතනය පවත්වන සිව් අවුරුදු කළමනාකරණ ඩිප්ලෝමාව පූර්ණ උපාධියක් ලෙසට රජයේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) සෘජුවම බැංකුව වෙත කරන ලද රු.285,804ක තැන්පතු සමාලෝචිත වර්ෂය අවසානයට හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමුද්‍රා හෝටලයේ වර්ෂය තුළ ආදායම් ලබාගැනීම සඳහා හෝටල් කාමර රාත්‍රී (Room Nights) 4745 ක් පවතින අතර එයින් ආයතනයට ලඟාකර ගත හැකි වූයේ හෝටල් කාමර රාත්‍රී 1442 ක් හෙවත් සියයට 30 ක් පමණි. ඒ අනුව හෝටල් කාමර උපරිමව උපයෝජනය කරවීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කොළඹ හෝටල් පාසලේ පන්ති කාමර සඳහා 2013 වර්ෂයේදී රු.2,725,000 ක් වටිනා මේස හා පුටු 200 බැගින් මිලදී ගෙන තිබුණි.එකී මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණේ පිරිවිතර හා නොසැසඳීම ලෙස වුවත් මිලදී ගැනීම සිදුකර තිබුණේද පිරිවිතරයේ සඳහන් නියමයන්ට පටහැනිවය.

### 4.4 දෘශ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ හෝටල් පුහුණු පාසලට හෝ ආයතනයට අයත් ප්‍රාදේශීය හෝටල් පාසල් වලට අයත් නොවන, පෞද්ගලික හෝටල් පාසලක සිසුන් 54 දෙනෙකුට සහ සංචාරක හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය මැදිහත් වී පවත්වා තිබුණු තරඟ වලට අදාල ජයග්‍රාහකයන්ට ප්‍රදානය කිරීම සඳහා කිසිදු පදනමකින් තොරව 2014 වර්ෂයේදී සහතිකපත් 245 ක්ද ඊට පෙර වර්ෂවලදී සහතිකපත් 900 ක් බැගින් ද නිකුත් කර තිබුණි. සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී එම උපාධිධාරී සංගමය විසින් නිකුත් කරන ලද එක් සහතික පත්‍රයක ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තනතුර වෙනුවෙන් ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු අත්සන් කර තිබුණි.

(ආ) හෝටල් පාසල සඳහා පරිත්‍යාග වශයෙන් ලැබෙන මත්පැන් වර්ග ගබඩාවට භාර නොදී ආහාරපාන අංශයේ ප්‍රධානියා භාරයේ ලේඛනගත කිරීමකින් තොරව තබා තිබුණි. එම තොග භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි රු.35,000 ක් වටිනා වයින් බෝතල් 12 ක් අස්ථානගත වී, තවත් මත්පැන් බෝතල් 06 ක හිඟයක් නිරීක්ෂණය වූ අතර එකී මත්පැන් ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ද යොදාගත් බවට සාක්ෂි නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.662,200 ක් වටිනා තේක්ක ඇඳි රහිත පුටු 52 ප්‍රයෝජනයට නොගෙන භෝජනාගාරයේ එළිමහන් ප්‍රදේශයක අනාරක්ෂිතව ගොඩ ගසා තිබුණි.

(ආ) හෝටල් පාසලේ 7 වන මහලේ ඉදිකර තිබූ රු.300,000 ක් වටිනා සමර් හට් 04 ක් ප්‍රයෝජනයට නොගෙන දිරාපත් වෙමින් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ වර්ග අඩි 2172 ක් කිසිදු අයකිරීමකින් තොරව බාහිර ආයතන සඳහා උපයෝජනයට ලබා දී තිබුණි.

(ඈ) ආයතනය සතු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණය කළමනාකරණය කර භාවිතයට නොගැනීම නිසා වර්ග අඩි 8547 ක් ආයතනය ආරම්භයේ සිටම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම උපයෝජනය කර නොතිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 අප්‍රේල් මාසයේ සිට 2014 ජුනි 30 දින දක්වා ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත ලොන්ඩ්‍රි සේවා සැපයීම වෙනුවෙන් ආයතනය විසින් දරන ලද පිරිවැය රු.887,028ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ ආහාරපාන අංශයට බඳවා ගත් බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙකුට 2013 වර්ෂයේ මාර්තු මාසයේ සිට 2014 වර්ෂයේ ජුනි මාසය දක්වා පංති වාර්තා පොත් අනුව වැඩ කළ දේශන පැය ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කර තිබීමෙන් රු.972,865 ක් ආයතනයට පාඩු වී තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ තනතුරු අතර නිළධාරීන් මාරු කිරීමේ විධිමත් පරිපාටියක් සකස් කර නොතිබූ අතර කළමනාකරණය විසින් වරින් වර සිදු කරන ලබන මාරු කිරීම් ක්‍රියාත්මක කරනු ලැබේ.

(ආ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 169 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 116 ක් විය. තනතුරු 56 ක පුරප්පාඩු සංඛ්‍යාවක් හා තනතුරු 3 ක අතිරික්තයක් නිරීක්ෂණය විය. අධ්‍යක්ෂ ජෙනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්, රෙජිස්ට්‍රාර්, අධ්‍යක්ෂ (මූල්‍ය) යන තනතුරු 04 ම සමාලෝචිත වර්ෂය තුළදී පුරප්පාඩුව පැවතුණි.

(ඇ) ආයතනයේ හෝටල් පාසලේ පවත්වා ගෙන යන කළමනාකරණ පාඨමාලාව, ප්‍රාථමික පාඨමාලාව සහ උසස් පාඨමාලාවට අදාල ලොන්ඩ්‍රි විෂයය සඳහා දේශන පැවැත්වීමට බඳවාගත් බාහිර කථිකාචාර්යවරයෙකු වෙත රාජකාරි පැවරුමක් ලබා දී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 11 දිනදීය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

---

ක්‍රියාකාරී සැලැස්ම අනුව ලබා කර ගත යුතු ඉලක්ක පැහැදිලිව හා ප්‍රමාණාත්මකව සඳහන් කර නොතිබුණු අතර සැලැස්මේ අන්තර්ගත වූ ක්‍රියාකාරකම් 10 ක් සමාලෝචිත වර්ෂය තුලදී ළඟා කර ගෙන නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

---

මුදල් රෙගුලාසි 134 හා 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව ආයතනය සඳහා තුන් අවුරුදු ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 5.5 අයවැය ලේඛනමය පාලනය

---

සමාලෝචිත වර්ෂයේදී ආදායම් හා වියදම් විෂයයන් 33 ක අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 22 සිට සියයට 245 දක්වා පරාසයක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

### 5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් 2013 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2018 මාර්තු 30 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ)ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොගැනීම. |

| | |
|---|---|
| (ආ) ආදායම් හා වියදම් කළමනාකරණය | (i) ලොන්ඩ්‍රි සේවා සැපයීම වෙනුවෙන් අයවිය යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබීම.<br>(ii) නිසි අධීක්ෂණයකින් තොරව බාහිර කථිකාචාර්ය දීමනා ගෙවීම් කර තිබීම. |
| (ඇ) සහතිකපත් නිකුත් කිරීම | සහතිකපත් පිළියෙළ කිරීම, නිකුත් කිරීම සම්බන්ධයෙන් සෘජු අධීක්ෂණයක් හෝ නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම. |
| (ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය | ඇතැම් අංශ සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබීම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබීම. |
| (ඉ) තොග සමීක්ෂණය | ඇතැම් තොග සමීක්ෂණ වාර්තාවල තොග සමීක්ෂණයට සහභාගී වූ නිලධාරීන්ගේ නම් සහ අත්සන් යොදා නොතිබීම, තොග සමීක්ෂණ වාර්තාවලට දත්ත ඇතුළත් කිරීමේදී සිදු කළ සංශෝධන සඳහා වගකිව යුතු නිලධාරියකු කෙටිසන් යොදා නොතිබීම. |